# බෞද්ධ සාහිත්‍ය විචාරය

## සෞන්දර්යය පිළිබඳ බෞද්ධ ආකල්පය.

සංගීතය, නෘත්‍යය, ගායනය, වාදනය ආදිය පමණක් නොව චිත්‍ර, මූර්ති, කැටයම් ආදිය ද, සිපවැළඳ ගැනීම ඈ ක්‍රියාවන් ද කලාවේ විවිධාඞ්ගයෝ වෙති. මෙම සියලු කලාඞ්ගයන්ගෙන් අපේක්ෂිත කාර්යය වන්නේ සෞන්දර්යය ආස්වාදය යි. සෞන්දර්යය **(Atheistic experience)** යනු කුමක්ද යන්න පිළිබඳ විවිධ අදහස් පවතී. සෞන්දර්යය, චමත්කාරය, ලස්සන, සොඳුරු බව යනාදී නම් ඒ සඳහා භාවිත කෙරේ. බටහිර හා පෙරදිග විචාරකයන් සෞන්දර්යය ආස්වාදය පිළිබඳ විවිධ මත පළ කරන අතර මෙකී විචාරකයන්ගේ මතය වන්නේ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන **(The three characteristics of Existance)** ත්‍රිලක්ෂණය පිළිබඳව අවධාරණය කරන දුක ජීවිතයේ ප්‍රමුඛ අත්දැකීමක් සේ සලකන ජීවිතයෙන් පලා යාමට **(Renunciation)** උපදෙස් සපයන බුදුදහම තුළ සෞන්දර්යය පිළිබඳ ආකල්පයක් තිබිය නොහැකි ය යන්නයි. විවිධ වියතුන් අතර ආනන්ද කුමාර ස්වාමි මහතා ප්‍රධානියෙකු වේ. ඔහු සිය සිව නෘත්‍යය **(Dance of Siva)** නම් කෘතියෙහි එකී මතය තහවුරු කිරීම සඳහා බෞද්ධ සාහිත්‍යයෙහි කරුණු කිහිපයක් ගෙන හැර දක්වයි.

01. දශශික්ෂාපද **(Ten Precepts)** අතර නැටුම්, ගැයුම්, වැයුම් ආදිය තහනම් කොට තිබීම.

"නච්චගීතවාදිත විසූකදස්සන මාලාගන්ධවිලෙපන ධාරණමණ්ඩනවිභූසනට්ඨානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි."

02. දසධම්ම සූත්‍රයෙහි භික්ෂූන්ට තමා අනවරතයෙන් විවර්ණ බවට පත්වූවෙකු ලෙස සිතීමට උපදෙස් දීම.

"වෙවණ්ණියම්හි අජ්ඣූපගතොති පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං"

03. චුල්ලවග්ගයේ ඛුද්දකවත්ථු ඛන්ධක යේ එක්තරා භික්ෂුවක් විසින් තම කාමරයෙහි බිත්තියක අඳින ලද මිථුන **(couple)** රුවක් බුදුරදුන් විසින් ගර්හා කොට මකවා දැමීම යැයි සඳහන් වී තිබීම.

මෙකී කරුණු වලට අමතරව බුදුදහමේ ඉගැන්වෙන අනීශ්වරවාදී ඉගැන්වීම් යනාදිය ද දක්වමින් තවත් බාහිර විචාරයකයෝ ජීවිතාස්වාදය පිළිබඳව බුදුදහම දක්වන ආකල්පය නිර්දය විවේචනයට ලක් කරති.

සැබවින්ම බුදුදහම සෞන්දර්යයාස්වාදයට විරුද්ධ ද? යන්න දාර්ශනික සාකච්ඡාවට බඳුන් විය යුත්තකි. අනිත්‍ය, දුක්ඛ ආදිය ජීවිත යථාර්ථය යි. එය දාර්ශනික සත්‍යයකි. බුදුන් වහන්සේ දේශනා කළේ මෙම දාර්ශනික සත්‍යය පැහැදිලි කිරීමකි. ඒ පිළිබඳ අනුගාමිකයා

සවිඥානක බවට පත් කිරීමකි. විශ්ව යථාර්ථය තේරුම් ගැනීම සෞන්දර්යයට හානිකර ද යන්න විමසීමෙන් මේ පිළිබඳ යම් අවබෝධයකට පැමිණිය හැකි ය. බුදුදහම තුළ ඉගැන්වෙන මෙම කරුණු විවරණය කරන එය සෞන්දර්යයට විරුද්ධ නොවන බව මුල්වරට බටහිර විචාරකයන්ට පැහැදිලි කර දීමේ ගෞරවය **මහාචාර්ය ජොතිය ධීරසේකර**යන්ට හිමි වේ. මෙම මතය යල් පැනගිය අදහසක් සහ බුදුදහම පිළිබඳ දැනුම අඩුබව නිසා ඉදිරිපත් කරන්නක් බව ඔහු **"Buddhism & beauty"** නම් කුඩා කෘතියෙන් පහදා දුන්නේය. බෞද්ධ සාහිත්‍ය විචාරය නැමැති විෂය ක්ෂෙත්‍රය මෙරට විශ්වවිද්‍යාල ඔස්සේ පෝෂණය වීමට ඔහු කළ මෙම හැඳින්වීම අතිශය ප්‍රබල වූවකි. ඉන් අනතුරුව මෙය විෂයක් වශයෙන් පුළුල් කිරීමේ ගෞරවය **මහාචාර්ය ඔලිවර් අබේනායක**ට හිමි වේ.

මෙකී පඬිවරු බුදුදහමේ සෞන්දර්යය පිළිබඳ ආකල්පය විවරණය කිරීමට ත්‍රිපිටකයෙන්ම කරුණු ගෙනහැර දැක්වූහ. බුදුන් වහන්සේ සෞන්දර්යය ආස්වාදය උපරිමයෙන්ම විඳනය කළ උතුමෙකු බව කිව යුතුය. ගිහිකල ඔහුට තුන් කලට නිසි ප්‍රාසාද තුනක් විය. ඒවායේ අවිවාහක තරුණ ස්ත්‍රීන් විසින් නිරතුරු සපයන ලද පසඟතුරු නදින් යුතු හෙතෙම මතුමහල් තෙලෙන් පහත මාලයට බැසීමට අනවශ්‍ය තරම් සුඛෝපභොගී ජීවිතයක් ගත කළ රූමත් තරුණ කඩවසම් පුද්ගලයෙකු විය. මොහු අෂ්ටාරශ කලාවන් පිළිබඳ පරතෙරට පැමිණ සිටි බව කියැවේ.

**"තිණ්ණං වෙදානං පාරගු සනිගණ්ඩු කෙටුභානං සාක්ඛරප්පභෙදානං ඉතිහාසපඤ්චමානං පදකො වෙය්‍යාකරණො ලොකායතමහාපුරිසලක්ඛණෙසු අනවයො" (කූටදන්ත සූත්‍රය)**

ඔහුගේ කුසලතා ගැන සඳහන් වන තැන්හි යෙදෙන 'කෙටුභ' යන වචනයෙහි අරුත කාව්‍ය ශාස්ත්‍රය යන්නයි. බුද්ධත්වයට පැමිණීමෙන් පසු මුන්වහන්සේගේ මෙම සෞන්දර්යය විඥානය තියුණු වූවා මිස මොට වූයේ නැත. උන්වහන්සේ සෞන්දර්යය විෂයෙහි කොතරම් රුචිකත්වයක් දැක්වූයේ ද යන්න කිඹුල්වතට ගෙන්වා ගැනීමට කාළුදායි ඇමතියා විසින් උන්වහන්සේගේ සෞන්දර්යය විඥානයට කරණු ලබන ආමන්ත්‍රණයෙන් පැහැදිලි වේ. මීට අමතරව බුදුන් වහන්සේ සොබාදහමට ප්‍රිය කළ අවස්ථා ගැන සඳහන් වන තැන් රාශියක් වේ.

මහාපරිනිබ්බාන සූත්‍රයෙහි බුදුරදුන් විසින් වදාළ රමණීය තැන් කිහිපයක් ගැන සඳහන් වේ. ආනන්දය වෙසාලිය ලස්සනය, උදෙන චෛත්‍ය, ගොතමක, සත්තම්බක යන ස්ථාන රමණීය ය. මීට අමතරව අරියපරියෙසන සූත්‍රයෙහි නෙරඤ්ජරාවට පැමිණි කල එහි සුදුවැලි තලාව දැක සිතුනු අදහස් මෙසේ සඳහන් වේ.

**"තස්ස මය්හං, භාරද්වාජ එතදහොසි - රමණීයො වත, භො, භූමිභාගො, පාසාදිකො ච වණසණ්ඩො නදී ච සන්දති සෙතකා සුපතිත්ථා රමණීයා සමන්තා ච ගොචරගාමො, අලං වතිදං පධානත්ථිකස්ස කුලපුත්තස්ස පධානාය" (සඞ්ගාරව සූත්‍රය)**

යනුවෙන් මෙම බිම්කඩ රමණීය ය, ප්‍රසාදජනක ය, වන ලැහැබ ඇත්තේ ය, මනාතොටක් ඇත්තේ ය, සුදුවැලිතලාවක් ඇති නදිය ගලාබසී, මෙය කුලපුත්‍රයෙකුට පධන් වීර්ය වැඩීමට සුදුසු ය. මෙබඳු ප්‍රකාශන ත්‍රිපිටකයෙහි සුලබව සොයාගත හැකි ය. එසේම බුදුන් වහන්සේ සෞන්දර්‍යයීය විරෝධියෙකු ලෙස සැලකිය හැකිද ?

බුදුන් වහන්සේ වූ කලි අසාමාන්‍ය වූ සමාජ විද්‍යාඥයෙකි. යමක් සමාජ සත්ත්වයෙකුගේ අවශ්‍යතාවක් නම් එයට විරුද්ධ වීමට තරම් බුදුන් වහන්සේ නැණමඳ නොවූහ. සමාජවිද්‍යාත්මක යමක් එම සමාජයේ අවශ්‍යතාවක් නම් එයට විරුද්ධව ප්‍රදානය කරණු ලබන කිසිවක් සමාජය විසින් ආරක්ෂා නොකරණු ලබයි. ඒ නිසා ලස්සන දේ අවලස්සන යැයි කීමට බුදුහු උත්සුක නොවූහ. එහෙයින් ලස්සන හෝ චමත්කාරය කුමක්දැයි තේරුම් ගත යුතු ය. මීට බුදුන් වහන්සේගේ ආකල්පය පැහැදිලි කෙරෙන දේශනාවක් සංයුක්ත නිකායේ 'න කාම කාම' සූත්‍රයෙහි

**"න තෙ කාමා යානි චිත්‍රාණි ලොකෙ - සංකප්පරාගො පුරිසස් කාමො**

තිට්ඨන්ති චිත්‍රාණි තථෙව ලොකෙ - අථෙත්ථ ධීරා විනයන්ති ඡන්දං"

(**ලොව විසිතුරු දේවල් කාමයෝ නොවෙති. මිනිසාගේ සංකල්ප රාගයන් කාමය නම් වේ.**)

දේශ, කාල භේද අභෙදොපචාරයෙන් කලාවගේ ගුණාත්මක වටිනාකම නිර්ණය කරණු ලැබේ. වෙනත් විධියකින් කිවහොත් කලාව දේශ, කාල භේද රහිත ය. බුදුන් වහන්සේ එබඳු වටිනාකමකින් යුත් කලාත්මක වින්දනය අගය කළ බවට සාධක සුලභ ය. කිසියම් සුන්දර වස්තුවක සුන්දරත්වය එකී වස්තුවෙහි වරදක් නොවේ. එය රාගනිශ්‍රිතව ග්‍රහණය කිරීම වරදක් වේ. මජ්ඣිම නිකායේ චූලසච්චක සූත්‍රයේ මෙසේ දැක්වේ.

**"මහනෙනි, යම් සැපයක් කාමයෙන් හා අකුසලයෙන් තොරනම් එබඳු සැපයට මම බිය නොවෙමි."**

(න ඛො අහං භායාමි යං තං සුඛං අඤ්ඤත්‍රෙව කාමෙහි අඤ්ඤත්‍රෙව අකුසලෙහි ධම්මෙහි)

මේ නිසා වින්දනය හෝ ආස්වාදය වරදක් වන්නේ එහි මානුෂික බලපෑම මත ය. මේ බව තවත් සූත්‍රදේශනා රාශියකින් සනාථ කරගත හැකි ය.

රහතන් වහන්සේලාගේ වින්දනය අලෞකික හා නිරාමිස වූවක් බව ප්‍රසිද්ධ කරුණකි. එම අලෞකික වින්දනයෙහි ස්වභාවය හඳුනා ගැනීම ලෞකික අපගේ වින්දනය විධිමත් කර ගැනීම සඳහා උපයෝගී වේ.

**"යදා බලාකා සුචිපණ්ඩරච්ඡදා - කාලස්සමෙඝස්ස භයෙන තජ්ජිතා**

**එලෙහීති ආලයමාලයෙසිනී - තදා නදී අජකරණී රමෙති මං"**

(කළු වලාකුළුවලට බියෙන් සිය සුදු පියාපත් විදාගෙන බාලකාවලිය පියාඹන අජකරණී නදිය මගේ සිත පිනවයි.)

**"රමණීයානි අරඤ්ඤානි - යත්ථ න රමතී ජනො**

**වීතරාගා රමෙස්සන්ති- න තෙ කාම ගවෙසිනො"**

(යම් වනයෙක්හි පුහුදුන් ජනයෝ ඇලුම් නොකෙරෙත් ද එබඳු වනයන්හි වීතරාගී රහත් උතුමෝ ඇලෙති. ඔව්හු කාමගවේෂීහු නොවෙති.)

යථෝක්ත ප්‍රකාශන දෙක රහතන් වහන්සේලාගේ විඥනය පුහුදුන් මිනිසුන්ගේ විඥනයෙන් වෙනස් වන ආකාරය හඳුනා ගැනීමට කදිම නිදසුන්ය. එහි පළමු නිදසුනෙන් රහතුන්ගේ හා පුහුදුන් අයගේ විඥනයේ ස්වභාවය සමබවක් පෙන්නුම් කරයි. එය මතු පිටින් බැලූ බැල්මට තේරුම් ගත නොහැකි ය. එහෙත් දෙවන නිදසුන තහවුරු කරන්නේ පෘථග්ජනයන් ලෞකික ආස්වාදයට රුචි කරන බවත් රහතුන් යථාර්ථය දැකීමෙන් ලබන විඥනය සහ ආස්වාදය පිළිබඳවත් ය. සැබවින්ම රහතුන්ගේ විඥනය, ආස්වාදය කෙබඳු ද යන්න තීරණය කිරීමට ලෞකික අප නිර්ණායක සෙවීම කළ නොහැක්කකි. ලෞකික අපට අලෞකිකත්‍වය පිළිබඳ මිනුම්දඬු නැත. එබැවින් අලෞකිකත්‍වය හා එහි ආස්වාදය අලෞකිකත්‍වයෙන්ම පසක් කළ යුත්තකි. රහතුන් වැනි උතුමන්ගේ සෞන්‍දර්‍යය ආස්වාදය ගැන සිතිය යුත්තේ මෙම සන්‍දර්භයේ සිට ය.

කාලුදායී ඇමතියා බුදුරදුන් කිඹුල්වතට වැඩම කරවා ගැනීම පිණිස කළ පරිසර වර්ණනය සෞන්‍දර්‍යය පිළිබඳ බුදුන් වහන්සේ දැක්වූ අදහසක් බුදුදහමේ ආකල්පයක් තීරණය කළ හැකි ය.

**"අඞ්ගාරිනො'දානි දුමා භදන්තෙ - එලෙසිනො ඡදනං විප්පහාය**

**තෙ අච්චිමන්තො'ව පභාසයන්ති - සමයො මහාවීර භගීරසානං"**

(හිමියනි, කිඹුල්වත කිඹුල්වත මග දෙපස වෘක්ෂයෝ දූන් ගිනි අඟුරුවැනිය. පරණ පත් වැටී දළු ලා ඇත. ඒවා දූන් ගිනි ගත්තාක් මෙන් බබළයි. වීරයන් වහන්ස, මෙයින් භගීරථයට යාමට මෙය කාලය යි.)

බුදුරදුන්ගේ සෞන්‍දර්‍යය විඥානයට අනුව බුදුහු කිඹුල්වතට යාමට තීරණය කරති. මෙයින් තහවුරු වන්නේ බුදුරදුන් වඩාත් ස්වභාව සෞන්‍දර්‍යයට රුචිකත්‍වයක් දැක්වූ බව යි.

සෞන්‍දර්‍යය පිළිබඳ බෞද්ධ ආකල්පය වටහා ගැනීමට වඩාත් ප්‍රයෝජනවත් වන කෘති දෙකක් ලෙස ථෙර, ථෙරී ගාථා සැලකේ. බුදුදහමෙන් ලද ආස්වාදයෙන් හුදු රහත් තෙරවරුන් හා තෙරණියන් තම ගිහි ජීවිතය හා පැවිදි ජීවිතය පිළිබඳ කරන ප්‍රකාශන මෙහි

ඇතුළත් වේ. ඔවුන් බුදුදහමෙහි පැවිදිව සිටින යථාර්ථය තේරුම ගැනීමෙන් ලද ආස්වාදය අප්‍රමාණ ය.

**"සුමුත්තා සාධු මුත්තාම්හි - තීණි ඛුජ්ජෙහි මුත්තියා;**

**උදුක්ඛලෙන මුසලෙන - පතිනා ඛුජ්ජකෙන ච"**

(මිදුනා මිදුනා මම මිදුනා තුන් කුදුයෙන් මිදුනා. මොල් ගසෙන් වන්ගෙඩියෙන් සහ කුදු සැමියාගෙන් මිදුනා.)

අනන්ත අප්‍රමාණ සම්බාධක භාරතීය වනිතාවට උරුමව තිබූ බව අපි දනිමු. මෙම සම්බාධක ජය ගැනීමෙන් ලද ආස්වාදය එකී ඛුජ්ජාථෙරී ගාථාවෙන් අනාවරණය වේ. අම්බපාලි ථෙරීගාථාවෙන් අනාවරණය වන්නේ ජීවිත යථාර්ථය පිළිබඳ තවත් පැතිකඩකි. පහත සඳහන් පද්‍ය ඊට නිදසුන් ය.

**"කාලකා භමරවණ්ණාදිසා - සොභරෙ සුථනකා පුරෙ මම;**

**ථෙව්ඛීව ලම්බන්ති නොදකා - සච්චවාදි වචනං අනඤ්ඤථා"**

(පිරුණු, වටකුරු, උඩට නැගුණු අග් ඇති, මනා පියයුරු පෙර මට විය. ඒවා දැන් දිය නැති පෙරහන් කඩ වැනිය. බුදුරදුන්ගේ වදන නම් සැබෑවයි.)

මෙම පද්‍ය පන්තියේ කාව්‍යමය චින්තනයත්, කාව්‍යමය ප්‍රයෝග භාවිතයත්, නිර්මාණාත්මක කුසලතාවත්, දාර්ශනික චින්තනයත් ඒකීභූත වී ඇත. සෑම පද්‍යයකම මුල් අර්ථය තුළ ඇගේ රූසපුවේ පැවති චමත්කාරය වර්ණනා කෙරෙන අතර එය ශෘඞ්ගාරාත්මක රසයෙන් යුතුය. එහෙත් ඉන් අනතුරුව රාගය නසන උපමාවක් ද දක්වා ඇත. පද්‍ය අවසාන වන්නේ එකම ප්‍රකාශය නැවත නැවත කීම හෙවත් ධ්‍රැවපදයෙකිනි. මෙම අම්බපාලි ථෙරී ගාථාවලට සමාන ථෙරීගාථා කිහිපයක්ම හමුවේ. ඉසිදාසි, සුභා ජීවකම්බවනිකා වැනි ථෙරීගාථා ද, වංගීස, මහාමොග්ගල්ලාන, මහාකස්සප, එකවිහාරී වැනි ථෙරගාථා ද කියවා බැලීම මේ සඳහා ප්‍රයොජනවත් වේ.

සෞන්දර්යය, සෞන්දර්යයක් ලෙස කෙනෙකුට බැලිය නොහැකි වන්නේ ඔහු රාගයෙන් මුසපත් වූ විට ය. රාගය ගැටීම් ඇති කරවයි. පහත සඳහන් නිදසුන එයට කදිම සාධකයකි.

**"යථා හරිතාලෙන මක්ඛිතං - අද්දස චිත්තීකතං විද්‍යාකතං;**

**සඤ්ඤා තෙ විපරීත දස්සනා - සඤ්ඤා මානුසිකා නිරත්ථකා"**

(බිත්තියක හිරියල්වලින් අඳින ලද චිත්‍රයකට මිනිසෙකැයි සිතීම විපරීත දර්ශනයකි. එහි මිනිසෙකු යන සඤ්ඤාව නිරර්ථකය.) (=ගොසිඞ්ග සූත්‍රය)

# ආඛ්‍යාන වශයෙන් වැදගත් වන පාලි සූත්‍රාගත දේශනා

1. ධම්මීකථා 2. දාන, සීල කථා 3. තිරච්ඡාන කථා 4. සම්මුති කථා

5. පරමත්ථ කථා 6. සප්පටිහීර කථා - අප්පටිහීර කථා 7. පවිවේක කථා

ධර්මය සන්නිවේදනය කිරීම සඳහා ආඛ්‍යාන භාවිතය වේද යුගය දක්වා ඈතට ගමන් කරයි. ආඛ්‍යානවලින් පිරිපුන් වේද සාහිත්‍යය ලෞකික සංස්කෘත සාහිත්‍යය පෝෂණය කිරීමට ඉවහල් වූ ආකාරය ඉතා පැහැදිලි ය. රාමායණය, මහාභාරතය වැනි කෘති පමණක් නොව අභිඥානශාකුන්තලය, සාවිත්‍රී උපාඛ්‍යානය වැනි කෘතිවලට පවා වස්තුබීජ වූයේ වේද සාහිත්‍යය යි. ඍග්වේදයේ 'යම යමී' සංවාදය, 'ඌර්වශී පුරූරවස්' සංවාදය මෙයට කදිම නිදසුන්ය. මෙයින් සනාථ වන්නේ ආගමික සාහිත්‍යයට ආඛ්‍යාන අත්‍යවශ්‍ය අංගයක් වූ බවයි.

බුදුන් වහන්සේ ද තම දේශනා සඳහා ආඛ්‍යාන උපයෝගී කොට ගත්හ. ඒවා කථා යන නමින් අපගේ ව්‍යවහාරයට පැමිණේ. පෙළ සාහිත්‍යය පිරික්සීමේ දී බුදුරදුන් විසින් දේශිත කථා වර්ග කිහිපයක් දැකිය හැකි ය. ඒවා ඉහත සඳහන් කරන ලදී. මෙබඳු විවිධ කථා අතර බුදුරදුන් විසින් තහනම් කරන ලද කථා මෙන්ම අගය කරන ලද කථා ද වේ. භික්ෂූන් විසින් ඒකරාශී වූ තැනකදී දහැමි වූ කථාවක් කළ යුතු බවත් නො එසේ නම් නිශ්ශබ්ද වීම උතුම් බවත් බුදුහු වදාරති. ජාතක පාලි නමැති ත්‍රිපිටක ග්‍රන්ථයේ බුදුරදුන් විසින් දේශිත යැයි සැලකෙන ජාතක කථා පන්සිය හතළිස් හතක් ඇතුළත් වේ. ඒවා විවිධ සාහිත්‍ය ක්ෂේත්‍ර පෝෂණයට වස්තුබීජ වී ඇත. එම කථා සිංහල සාහිත්‍යයට පදනම් වී ඇති ආකාරය කව්සිළුමිණ, අමාවතුර, බුත්සරණ, ගුත්තිල කාව්‍යය, විලාසනියකගේ ප්‍රේමය, අමා වැස්ස වැනි කෘති පිරික්සීමෙන් පැහැදිලි වේ.

මුල් බුදු සමයට අයත් යැයි සැලකෙන සූත්‍රාන්ත දේශනා වල පවා ආඛ්‍යාන ගැඹුරු ධර්ම පර්‍යායයන් විවරණය කිරීමේ දී යොදාගෙන ඇති අයුරු දක්නට ලැබේ. **මජ්ඣිම නිකායේ උපාලි, රට්ඨපාල, ඝටීකාර, මඛාදේව, කකචූපම, සච්චක, සක්කපඤ්හ** වැනි සූත්‍ර ද, **උදානපාලියේ සංගාමජි, නන්ද, ගබ්භිනී** යනාදී සූත්‍ර ද මෙයට නිදසුනි. මෙම සූත්‍ර සියල්ලම දේශනා කොට ඇත්තේ ගැඹුරු ධර්ම පර්‍යායයන් විවරණය කිරීම සඳහා ය. ඒවා හුදු විනෝදාස්වාදය සඳහා වෙන් කරන ලද ඒවා නොවේ. වඩාත්ම වැදගත් කරුණ වන්නේ ඒවායෙහි සාහිත්‍යාත්මක ගුණාංග ප්‍රවේශ කොට තිබීමය. නිදසුනක් ලෙස මනෝවිද්‍යාත්මක උපදේශනයකින් යුතු සූත්‍රයක් ලෙස සැලකෙන රට්ඨපාල සූත්‍රය ගත හැකි ය. එය කාමයන්හි ආදීනම පෙන්වාදීම සඳහා දේශිත සූත්‍රයකි. කෝරව්‍ය රජුගේ එකම පුතුවන රට්ඨපාල කුමරු ගිහිසැප හැර දමා පැවිදි වෙයි. මවුපියන්ගේ බලවත් ශෝකයට මෙය හේතු වෙයි. කලකට පසු රට්ඨපාල හිමියෝ සිය මවුපියන් බැලීමට නිවසට පැමිනෙන කල්හී සිදුවූ සිදුවීම් දාමයක් මෙහි සඳහන් වේ.

මෙම සූත්‍රයෙහි සංවාද, සංකේත, ධ්වන්‍යාත්මක ප්‍රකාශන අවස්ථා නිරූපණය ආදිය ඇතුළත්ය. පහත දක්වෙන්නේ ඉන් කිහිපයකි.

**"සචෙයං භගිනී ඡඩ්ඪනීය ධම්මං පත්තෙ මෙ ආකිරාහි"**

(නැගණියනි, මෙය විසිකරන දෙයක් නම් මාගේ පාත්‍රයට දමන්න.)

**අත්‍ථි නාම තාත ආභිදොසිකං කුම්මාසං පරිභුඤ්ජිස්සසි?**

(පුත රට්ඨපාලය, ඉඳුල් ආහාර වළඳනවාය කියා දෙයකුත් ඇද්ද?

මෙම සංවාද අතර රට්ඨපාල හිමියන් සිය පෙර බිරියට **භගිනීවාදයෙන් ඇමතීම** නිසා ඔවුන් සිහිසුන්ව ඇද වැටීම, **රන්කහවණු පොදි බැඳ ගඟ මැදට ගොස් ගෙන දැමීමට පියාට උපදෙස් දීම** යනාදී අවස්ථා රාශියක් නිරූපණය වේ. මේවා පාඨකයාගේ චිත්තරූප මවන ප්‍රකාශන වේ. මෙම නිසා මෙම සූත්‍රය සාහිත්‍යාත්මකව ඇදහිය හැකි සූත්‍රයක් වේ.

මජ්ඣිම නිකායේ උපාලි සූත්‍රය කර්මය පිළිබඳ බෞද්ධ හා ජෛන මතය විවරණය කෙරෙන සූත්‍රයකි. ජෛන ලබ්ධිකයෙකු වූ උපාලි ගෘහපතියා බුදුරදුන්ගේ අදහස පිළිගනිමින් ජෛන කර්මවාදය ප්‍රතික්ෂේප කරයි. ඉන්පසු නිගණ්ඨනාථපුත්ත ගෘහපතියාට පෙර සේ ගරු සැලකිලි නො දක්වීමෙන් අතිශය චිත්තවික්ෂෝභයට පැමිනෙන නිගණ්ඨනාතපුත්ත විසින් ප්‍රකාශ කරනු ලබන උද්වේගී අදහස් මෙම සූත්‍රයෙහි ඉතා ආකර්ෂණීය ලෙස දක්වා ඇත. පෙර තෙල් කලයක් රැගෙන එන්නාක් මෙන් නිගණ්ඨනාථපුත්ත වැඩම කරවාගෙන උපාලි ගෘහපතියා කැමති අසුනක් ගෙන හිඳගන්න යැයි ප්‍රකාශ කළ විට නිගණ්ඨනාථපුත්ත උද්වේගයෙන් ගිගුම් දුන් අයුරක් සූත්‍රයෙහි මැවී පෙනේ.

**"උපාලි ගැහැවිය තෝ කෝෂ සහිතව ගොස් ඉගිලූ කෝෂ ඇතිව ආයේද"**යි ඔහු විචාල බව සූත්‍රයෙහි ඍජුවම දක්වා ඇත. මෙබඳු සංවාද සාමාන්‍ය ජන ව්‍යවහාර අනුව යැමෙන් එහි අවස්ථා නිරූපණය හා තදනුරූපී භාෂාව පාඨකයාගේ සිත ඇද ගනී. මෙබඳු භාෂාත්මක ලක්ෂණ බොහෝ සූත්‍රවල අන්තර්ගත වන්නේ ඒවා සාහිත්‍යාත්මක ගුණයෙන් උසස් කරලීම පිණිස ය.නිදසුනක් ලෙස උදාන පාලියේ නන්‍ද සූත්‍රයෙහි භාෂාව ගත හැකි ය. එහි කෙටි වාක්‍යවලින් පුළුල් අර්ථයක් දැනවීමට සමත් වේ. **"තුවටං තුවටං ඛො අය්‍යපුත්ත ආගච්ඡෙය්‍යාසි"** "ස්වාමිපුත්‍රය, ඉක්මනින් ඉක්මනින් එන්න." මෙම වාක්‍යයෙන් ප්‍රේමයේ සාඵල්‍යය ය සඳහා ජනපද කල්‍යාණිය තුළ පැවති උත්තේජනය ප්‍රකට කරයි. ඇගේ කායික සෞන්‍දර්‍ය්‍යය විවරණය කිරීම සඳහා සංස්කෘත කවියන් මෙන් කේශාන්තයේ සිට පාදාන්තය දක්වා කරණු ලබන වර්ණනාවක් මෙහි නැත. මෙම සූත්‍රයෙහි ම ඇගේ රූ සපුව පෙන්වීම සඳහා භාවිත කරන්නේ **"උපඩ්ඪුල්ලිඛිතෙහි කෙසෙහි"** (අඩක් ලිහී ගිය කෙස් වැටියෙන් යුතුව) වැනි පද කිහිපයකි. එසේම නන්‍ද කුමරුන් දෙව්ලොවට රැගෙන ගොස් බුදුහු

අප්සරාවන් පෙන්වති. මෙහි එන "**අච්ඡරා** (අප්සරා), **කකුටපාදානි** (පරවියන්ට බඳු රත්පැහැති පා ඇති)" වැනි පද පිළිබඳව ද සිතීම සුදුසු ය.

උදානපාලියේ එන සංගාමජී සූත්‍රය බුදුරදුන්ගේ භාෂා භාවිතය හා එහි සුවිශේෂී ලක්ෂණ හඳුනා ගැනීමට සුදුසු සූත්‍රයකි. බුදුරදුන් සැවැතට වැඩි බව අසා එක්තරා ස්ත්‍රියක් එහි යන අතරමග සිය සැමියා පැවිදිව ගසක් මුල හිඳිනු දකී. ඔහු ඉදිරියට යන ඕ තොමෝ මෙසේ පවසයි. "**බුද්දපුත්තාම්හි සමණ, පොසමන්ති.**" (ශ්‍රමණය, මම කුඩා පුතෙක් ඇත්තියක් වෙමි; මා පෝෂණය කරන්න.) මෙසේ තෙවරක් ඈ පැවසුව ද පැවිදි සැමියා (සංගාමජී) ඇස ඇර නොබලයි. එවිට පුතු ඔහු ඉදිරියේ තබන ඇය ඉවතට ගොස් සැඟවී (අපලොකෙන්ති) බලා හිඳී. එහෙත් සංගාමජී තෙර ඔහු දෙස නොබලයි. කථා නොකරයි. නෙව ඔලොකෙසි න ච ආලපි අනතුරු මෙම ශ්‍රමණයා දරුවන්ගේ ප්‍රයෝජන ඇත්තෙක් නොවේ යැයි පවසන ඇය දරුවා ද රැගෙන ඉවත යයි. මෙය දකින බුදුන් වහන්සේ, සංගාමජී යුද්ධය දිනුවේ යැයි උදන් අණති. මෙම කෙටි කථාවෙන් සංවාදමය ස්වරූපය ගැන දීර්ඝ විස්තර අනවශ්‍යයයි. එහි යොදන **අපලොකෙන්ති, අවිදූරං ගන්ත්වා, කුද්දපුත්තාම්හි** වැනි පද **ධ්වන්‍යාර්ථවත් ය.** නිදසුනක් ලෙස සංගාම යනු යුද්ධය යි. ජී යනු දිනීම යි. මේ අනුව කෙලෙස් යුද්ධය දිනීම මෙයින් අපේක්ෂිත යි. **මෙබඳු පද සංකේත පද නම් වේ. ව්‍යංගාර්ථවත් පද වේ. ආනන්ද වර්ධන** මේවා හැඳින්වූයේ **ව්‍යාඤ්ජනා** යනුවෙනි. මෙසේ ත්‍රිපිටක සූත්‍රාන්ත රාශියකම ආඛ්‍යානවල සාහිත්‍යාත්මක ලක්ෂණ පිළිබිඹු වේ. මෙබඳුම සාහිත්‍යමය ගුණයෙන් අනූන පද්‍යමය ආඛ්‍යාන ද දක්නා ලැබේ. සුත්ත නිපාතයේ නාලක සූත්‍රය මෙයට කදිම නිදසුනකි. එහි ඉතා උසස් පද්‍ය දක්නා ලැබේ.

"සෙලෙන්ති ගායන්ති ච වාදයන්ති - භුජානි ඵොටෙන්ති ච නච්චයන්ති

පුච්ඡාමි වොහං මෙරුමුද්ධවාසිනො - ධුනාථ මෙ සංසය ඛිප්ප මාරිසා"

යනාදී ගාථා මෙයට නිදසුන් ය. ජාතක පාලිය තුළ ද එබඳු ආඛ්‍යාන බහුල ය. මේවා සංවාද, සංකේත, අවස්ථා නිරූපණ, චිත්තජ රූප ජනනය, උපමා රූපක, ආදී අලංකාර භාවිතය යනාදී ලක්ෂණවලින් මෙන්ම මනුෂ්‍ය අධ්‍යාත්මයේ ගුප්තස්ථාන විවරණය කිරීම වැනි ලක්ෂණවලින් ද යුක්ත ය. ඒවා පාඨකයා ගේ ජීවිත අත්දැකීම් පුළුල් කරවීමට ඉවහල් වේ.

# ත්‍රිපිටක සූත්‍රාන්තයන්හි දක්නා ලැබෙන උපමා සහ රූපක

**01.** බුදුරදුන් ධර්ම සන්නිවේදනය කිරීමේදී යොදාග් විවිධ භාෂාමය උපක්‍රම අතර උපක්‍රම අතර උපමාව (**උප+මා = √මා පමාණෙ**) ද එකකි. උපමාවෙන් ගැඹුරු ධර්ම පදාර්ථයන් ඉතා සරල ආකාරයෙන් නිර්වචනය කළ හැකි වීම මෙයට හේතුව යි. **"උපමායපි භික්ඛවෙ ඉධෙකච්චෙ විඤ්ඤූ පුරිසා භාසිතස්ස අත්‍ථං ආජානන්ති"** *(මෙලොව ඇතැම් නුවණැති පුරුෂයෝ උපමාවෙන් ද භාෂිතාර්ථය දැන ගනිති.)* මෙයින් පැහැදිලි වන්නේ උපමාව ඥානෝපාය මාර්ගයක් ලෙස භාවිත කළ බව යි.

**02.** පෙරදිග තර්ක ශාස්ත්‍රවේදීහු උපමාව ඥානෝපාය මාර්ගයක් වශයෙන් පිළිගනී.

01. **ප්‍රත්‍යක්‍ෂ** (ප්‍රති+අක්‍ෂ) - ඉන්ද්‍රියාර්ථ සන්නිකර්ෂ ජන්‍යං ඥානං ප්‍රත්‍යක්‍ෂම්.

02. **අනුමාන** - අනුමිති කරණමනුමානම්. (අනුමානය)

03. **උපමාන** - උපමිති කරණමුපමානම්. (උපමාව)

04. **ශාබ්ද** - ආප්ත වාක්‍යං ශබ්දඃ. (පිළිගත යුත්තෙකුගේ වචනය)

බුදුන් වහන්සේ ද උපමාව (**Simile**) මෙලෙසින් ඥානය ලබා ගැනීමේ ක්‍රමෝපායක් හැටියට සැලකූ බවට නිදසුන් ත්‍රිපිටක සාහිත්‍යයෙන් සොයා ගත හැකි ය. පහත දැක්වෙන්නේ ඒ සඳහා නිදසුන් කිහිපයකි.

**01. "තෙනහි සන්‍දක උපමං තෙ කරිස්සාමි."**

*(එසේ වී නම් සන්‍දකය උපමාවක් කියන්නෙමි.)*

**02. "උපමා මං භන්තෙ පටිභාති."**

*(ස්වාමීනි මට උපමාවක් වැටහේ.)*

**03. "උපමා මං ආවුසො පටිභාති."**

*(ඇවැත්නි මට උපමාවක් වැටහේ.)*

**04. "උපමා ඛො අයං භික්ඛවෙ කතා අත්ථස්ස විඤ්ඤාපනාය."**

*(මහණෙනි, අර්ථය අවබෝධ කරවීම සඳහා මේ උපමාව කරන ලදී.)*

**05. "කුල්ලූපමං වො භික්ඛවෙ ධම්මං දෙසිස්සාමි, නිත්තරණත්‍ථාය නො ගහණත්‍ථාය"**

*(මහණෙනි, තොපට ධර්මය පහුරකට උපමා කොට දෙසමි. එතෙර වීම පිණිස ය. ගැනීම සඳහා නොවේ.)*

**06. "එවමෙව ඛො භාරද්වාජ අන්‍ධවෙණූපමං මඤ්ඤෙ බ්‍රාහ්මණානං භාසිතං සම්පජ්ජති."**

*(භාරද්වාජ, එලෙසින්ම බ්‍රාහ්මණ භාෂිතය පිළිගත් අය අන්ධරැළකට සමාන යැයි කියමි.)*

**07. සක්කා පන භන්තෙ උපමං කාතුං? සක්කා භික්ඛූති.**

*(ස්වාමීනි උපමාවක් කියන්නට හැකි ද? හැකිය මහණෙනි.)*

08. **“යෙ කෙචි රූපා ඉධ වා හුරං වා - යෙ අන්තලික්ඛස්මිං පභාසවණ්ණා**

**සබ්බෙව තෙ තෙ නමුචිප්පසත්ථා - ආමිසං’ව මච්ඡානං වධාය ඛිත්තා”**

*(මෙලොව හෝ පරලොව හෝ අහසෙහි හෝ යම්කිසි පැහැපත් රූපයෝ වෙත් නම් ඒ සියල්ලම මාරයා විසින් පසස්නා ලද්දාහු ය. නමුත් ඒවා මසුන් නැසීමට ඇටවූ ඇම මෙනි.)*

09. **“උපමාය’පි න ඉධං සුකරං විඤ්ඤාපණාය.”**

*(මෙය උපමාවකිනුදු අවබෝධ කිරවීම ලෙහෙසි නැත.)*

10. **“ඔපම්මං කරොහි භන්තෙ.”**

*(උපමාවක් කියන්න ස්වාමීනි.)*

11. **“භියෙ‍ාා ඔපම්මං කරොහි.”**

*(තවත් උපමාවක් කියන්න.)*

බුදුන් වහන්සේ උපමාව මෙසේ වැදගත් කොට සලකා ඇත්තේ එහි සන්නිවේදනාත්මක පහසුව සලකා ගෙන ය. කාව්‍ය විචාරය සම්බන්‍ධයෙන් ද මෙහි උපයෝගීතාව විවිධ විචාරකයෝ පෙන්වා දුන්හ. **“උපමා කවිවංශස්‍ය - මාතරෙති මතිර්මම”** යනුවෙන් **භොජ් කවියා** පැවසීය. **සුබෝධාලංකාරයෙහි** උපමාව නිර්වචනය කොට ඇත්තේ මෙසේ ය.

**“උපමානොපමෙය්‍යාං - සාධම්මත්තං සියොපමා,**

(සද්දත්‍ථගම්මා වාක්‍යත්‍ථා - විසයාති ච සා තිධා)”

ඒ අනුව උපමාව යනු කිසිවක් තව වස්තුවකට සමාන යැයි කීමම නොවේ. උපමාන, උපමෙය යන දෙදෙනාගේ සාධර්ම්‍යතාව හෙවත් ගුණාත්මක වශයෙන් සමාන බව දැක්වීම උපමාව නම් වේ.

ත්‍රිපිටකයේ උපමා නාමයෙන්ම දක්වෙන සූත්‍ර ඇත. **කකචූපම, අලගද්දූපම, අග්ගික්ඛන්ධොපම, සාරොපම, මහාහත්‍ථිපදොපම, ලටුකිකොපම,** යනාදිය ඊට නිදසුන් ය. එසේ නොවන **මධුපිණ්ඩික, වම්මික, රථවිනීත, නිවාප** වැනි සූත්‍රවල ද උපමා දක්නා ලැබේ. මෙම උපමා බෞද්ධ දාර්ශනික ප්‍රස්තුත විවරණය කිරීමෙහිලා අතිශයින් ප්‍රයෝජනවත් වී ඇත. වම්මික සූත්‍රයෙහි පඤ්චස්කන්ධය තුඹසකට උපමා කොට ඇත. අවිද්‍යාවත්, තණ්හාවත්, උපාදානය යනාදිය ද උපමා මගින් එහි විස්තර කොට ඇත. රථවිනීත සූත්‍රයෙහි රජෙකු රථ හතකින් ගමන් යන්නාක් මෙන් විසුද්ධි 07 කින් **(01. සීල විසුද්ධි. 02. චිත්ත විසුද්ධි. 03. දිට්ඨි විසුද්ධි. 04. කංඛාවිතරණ විසුද්ධි. 05. මග්ගාමග්ගඤාණදස්සන විසුද්ධි. 06. පටිපදා ඤාණදස්සන විසුද්ධි. 07. ඤාණදස්සන විසුද්ධි** ) යෝගාවචරයා නිවනට යන අයුරු පෙන්වා දී ඇත. පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන සතර මහාභූත කොහිදී නිරුද්ධ වේ ද? යන්න කේවඩ්ඪ සූත්‍රයේදී පෙන්වා දී ඇත. එහි නැව් යන අය කපුටෙකු රැගෙන යාම උපමාවට ගෙන ඇත.